ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**ඔක්තෝබර් 2020**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

## 2020 ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.

**ඔක්තෝබර් මස මුල සිට ආරම්භ වූ COVID-19 වසංගතයේ දෙවන රැල්ලේ අහිතකර බලපෑම් හේතුවෙන් 2020 ඔක්තෝබර් මාසයේදී නිෂ්පාදන කටයුතු වල ක්‍රියාකාරීත්වයේ පහළ යාමක් පෙන්නුම් කරන ලදී.** ඒ අනුව, විශේෂයෙන්ම ඇඟලුම් නිෂ්පාදන සහ ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශවල නිෂ්පාදනය, නව ඇණවුම්, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් වල සිදුවූ සැලකිය යුතු පහළ යාම හේතුවෙන් නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ඔක්තෝබර් මාසයේදී 40.3ක් දක්වා පහළ යන ලදී.

ඔක්තෝබර් මාසයේදී සේවා නියුක්තිය පහත වැටීම ද සමඟ සියලු නිෂ්පාදන අංශවල නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහත යන ලදී. වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා මෙම මාසය තුළ පැනවූ ඇඳිරි නීතිය හේතුවෙන් සිය කර්මාන්තශාලා මෙහෙයුම් සඳහා විශාල වශයෙන් බාධා ඇති වූ බව ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල බොහෝමයක් ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. තවද, වසංගතයට ඇති බිය නිසා සමහර සේවකයින් සේවයට වාර්තා කිරීමට මැලිකමක් දැක්වූ අතර, බොහෝ සේවා යෝජකයින් සෞඛ්‍ය බලධාරීන්ගේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් ඔවුන්ගේ පූර්ණ ශ්‍රම බලකාය සේවයේ යෙදවීමෙන් වැළකී සිටි බැවින් සේවයේ යෙදවුන සේවක සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුනු බවත් එම ප්‍රතිචාර දැක්වූවන් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

තවද, නිෂ්පාදනය සහ නව ඇණවුම් පහත වැටීම මෙන්ම අවිනිශ්චිතතාව ඉහළ යාමත් සමඟ තොග මිලදී ගැනුම් උප දර්ශකයද වැඩි වේගයකින් පහළ යන ලදී. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය වැඩි වේගයකින් ඉහළ ගිය අතර, මෙහිදී වරාය/රේගු නිෂ්කාශනයේ සැලකිය යුතු ප්‍රමාදයක් අත්විඳීමට සිදුවූ බව බොහෝමයක් ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **59.8** | **40.3** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 61.7 | 43.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 63.3 | 30.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.6 | 25.8 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 56.9 | 37.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 63.3 | 72.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන සමස්ත අපේක්ෂාවන්ගේ උප දර්ශකය සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මේ සඳහා විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ වැඩි වශයෙන් COVID-19 වසංගතයේ දෙවන රැල්ල ව්‍යාප්ත වීම හේතු විය.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**40.3**

**2020 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 19.5ක පහළ යෑමකි**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6 කින් ඉහළ යමින් 2020 ඔක්තෝබර් මාසයේදී 53.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 ඔක්තෝබර් මාසයේදී ඉන්දියාව, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ චීනයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් වැඩි වේගයකින් ඉහළ ගිය අතර, යුරෝපා කලාපයෙහි එම දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, COVID-19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 නොවැම්බර් 16 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.